**ශීර්ෂය 177 -සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව |

2. **ගිණුම්**

2.1 **විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,640,626,987 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,377,529,329 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. 127,658,825 ක් හා රු.135,438,833 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10.9 ක් හා 28.4 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 177 | 1,163,880,000 | 1,036,221,175 | 127,658,825 | 10.9 |
| 206 | 476,746,987 | 341,308,154 | 135,438,833 | 28.4 |
| එකතුව | 1,640,626,987 | 1,377,529,329 | 263,097,658 | |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17701 | 32,000,000 | 16,262,818 | 14.000,000 | 15,146,701 | 110,000,000 | 65,190,519 |
| 20601 | 19,000,000 | 10,684,781 | 8,000,000 | 9,485,835 | 87,000,000 | 39,615,396 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.47,748,431 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- | --- |
| | | රු. |
| සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0054/000 | 37,538,310 |
| සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0088/000 | 10,210,121 |
| | | 47,748,431 |

**2 කොටස**

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

1. **ශීර්ෂය 177 - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

1.1 **විගණන විෂය පථය**

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 05 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **<u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම</u>**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 **<u>විගණන නිරීක්ෂණය</u>**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ ) **<u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | <u>ලේඛන වර්ගය</u> | <u>අදාල රෙගුලාසිය</u> |
|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ii) | මෝටර් වාහන ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |
| (iii) | පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඇ) |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ආ) **<u>විගණන සාක්ෂි නොවීම</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෝටර් කාර් රථයක් හා ත්‍රිවිලර් 05 කට අදාලව එම වාහන ධාවනය කිරීම, නඩත්තුව හෝ ධාවනයෙන් ඉවත් කිරීම සම්බන්ධව කිසිඳු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ii) සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම හා මුදා හැරීම පිළිබඳ ලිපි ලේඛන මෙන්ම එක් එක් ඉදිකිරීමට අදාල සැලසුම්, පිරිවැය ඇස්තමේන්තු, ප්‍රමානපත්, මිනුම් වාර්තා, බිල්පත් හා ඉදිකිරීම්වල ප්‍රගති වාර්තා ඇතුලත්ව ලිපිගොනු අංගසම්පූර්ණ ලෙස පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) <u>විගණන විමසුම් වලට පිළිතුරුදීම</u>

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් එකකට 2014 ඔක්තෝබර් 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුමට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම (වැට් බදු සමග) රු.28,255,312 ක් විය.

(ඈ) <u>අයවැය විචලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 01 ක් සඳහා සළසා තිබුණු රු.25,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) මූලධන වැය විෂයයන් 3 ක් සහ පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 37 සිට සියයට 97 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) මූලධන වැය විෂයයන් 2 ක එකතුව රු.30,000,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. තවත් මූලධන වැය විෂයයන් 4 ක රු.111,000,000 ක්වූ සම්පූර්ණ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 34 සිට 86 දක්වා පරාසයක ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(iv) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව, වැය විෂයයන් දෙකක ඉතිරිවීම් ඉක්මවා ප්‍රවර්තන වර්ෂය තුළදී රු. 1,015,863 ක බැරකම්වලට එළඹ තිබුණි. තවද වැය විෂයයන් 4 ක ඉතිරිවීම් නොමැතිව තිබියදී රු. 1,760,902 ක බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.

(ඉ) **පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අංක. 6000/0/0/15/540 දරන පොදු තැන්පත් ගිණුමේ පැවති වර්ෂ දෙක ඉක්මවූ රු.6,635,068 ක වටිනාකම වූ තැන්පතු 65 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 17701 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට හිඟහිටි කාල පරිච්ඡේදය වර්ෂ 1 සිට 15 දක්වා වූ අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂ 20 ක එකතුව රු.1,155,493 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක. 118 දරන රාජ්‍ය අයවැය චක්‍රලේඛයේ 1.1 හා 1.1.6 වගන්ති අනුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අප්‍රමාදව ගිණුම් සාරාංශ මගින් පියවීමට කටයුතු කළයුතු බවත්, එම චක්‍රලේඛයේ 1.1.7 ඡේදය අනුව නිරවුල් නොවුණු ණය ශේෂ ගිණුම්වල නොපෙන්වීමට වගබලා ගත යුතු බවත්, සඳහන් වුවද ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් 2013 වර්ෂයට පෙර ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 13 කගෙන් අයවිය යුතු රු.1,265,398 ක මුළු ණය ශේෂයක් අයවිය යුතු ණය ශේෂ යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක. 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 වනවිටත් පිළියෙල කර නොතිබුණි.

1.5 **වත්කම් කළමනාකරණය**

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක. පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක. 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2014 අගෝස්තු 31 වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) නුවරඑළිය සංස්කෘතික මධ්‍යස්ථානයේ 2010 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පෙන්වාදී තිබූ, ඒ වන විට භාවිතයෙන් ඉවත් කර තිබූ ටකරන් 110 ක් වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබුණද 2013 වර්ෂය අවසන් වන විටත් ඒවා වෙන්දේසි කර නොතිබුණි.

(iii) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ නිල නිවස හා අමාත්‍ය කාර්යාල වෙත සංස්කෘතික අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද භාණ්ඩ වර්ග 48 ක අයිතම 129 ක් සම්බන්ධයෙන් කිසිඳු සමීක්ෂණයක් 2013 දෙසැම්බර් 31 දිනට සිදුකර නොතිබුණි. මෙම භාණ්ඩ වර්ග 48 න් 29 ක් විදුලි උපකරණ විය.

(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

(i) අමාත්‍යාංශය විසින් පහත සඳහන් වාහන අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණි.

| වාහන වර්ගය | වාහන සංඛ්‍යාව | ලබාදී ඇති ආයතනය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| මෝටර් කාර් | 2 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | වර්ෂ 2 කට වැඩි කාලයක සිට |
| මෝටර් කාර් | 2 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | වර්ෂ 5 කට වැඩි කාලයක සිට |
| ජීප් රථ | 1 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | වර්ෂ 2 කට වැඩි කාලයක සිට |

| | | | |
|---|---|---|---|
| කැබ් රථ | 2 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | වර්ෂ 2 කට වැඩි කාලයක සිට |
| කැබ්රථ | 1 | තොරතුරු ඉදිරිපත් නොකෙරුනි | වර්ෂ 13 ක සිට |

(ඇ) <u>වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණු මෝටර් වාහන 05 ක් විධිමත් අනුමැතියකින් තොරව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදවාගෙන තිබුණි.

(ii) මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් කැබ් රථයක් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ අවශ්‍යතාවය සඳහා රියදුරෙකුද සමග ලබාදී තිබූ අතර ඒ සඳහා ජනාධිපති ලේකම්ගේ 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛ උපදෙස් පරිදි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) <u>වාහන අවිධිමත් ලෙස පරිහරණය කිරීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කැබිනට් අමාත්‍යවරයෙකු සඳහා වෙන්කර දිය හැකි වාහන සංඛ්‍යාව ජනාධිපති ලේකම්ගේ 2010 මැයි 14 දිනැති CA/1/17/1 රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව 3 කට සීමාකර තිබීයදී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා වෙත වාහන 5 ක් වෙන්කර තිබුණි. එමෙන්ම අමාත්‍යවරයාගේ සේවාවන් සඳහා අනුයුක්ත කල හැකි රියදුරන් සංඛ්‍යාව ආරක්ෂක රථයේ රියදුරු හැර දෙදෙනකු වුවද රියදුරන් 4 දෙනකු එම වාහන සඳහා අනුයුක්ත කර තිබුණි.

(ii) කණ්ඩායම් ප්‍රවාහනය සඳහා ආයතනය විසින් යොදවා ඇති වාහනවල යාම හා ඒම වෙනුවෙන් භාවිතා කල හැකි උපරිම දුර ප්‍රමාණය කාර්යාලයේ සිට කිලෝමීටර් 50 කට සීමා විය යුතු නමුත් ඊට පටහැනිව 2013 ජනවාරි සිට ජූනි දක්වා කාලය තුලදී කාර්යාලයේ සිට වේයන්ගොඩ දක්වා කිලෝමීටර් 80 ක් දුරට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසා දී තිබුණි.

(iii) වෙන්කල වාහන හිමිකම ඇති නිලධාරීන් අතිරේක තනතුරක වැඩ ආවරණය කිරීම වෙනුවෙන් වාහන භාවිතා කල නොහැකි නමුත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ලෙස රාජකාරි ඉටු කල සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) විසින් 2013 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුලදී මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් සංචිත වාහනයක් පරිහරණය කර තිබූ අතර කි.මී.12,454 ක දුරක් ධාවනයේ යොදවා තිබුණි.

(ඉ) <u>පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම</u>

රු.15,771,125 ක් අමාත්‍යාංශ ප්‍රතිපාදන වැය කරමින් ඉදිකිරීම් නිමකර 2013 දෙසැම්බර් 31 දින වනවිට විවෘත කර තිබූ රත්නපුර දිස්ත්‍රික්කයේ සංස්කෘතික මධ්‍යස්ථාන 5 ක මෙන්ම, 2013 වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පැවති සංස්කෘතික මධ්‍යස්ථාන 6 ක භූමියේ අයිතිය අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරාගෙන නොතිබුණි. එසේ වුවද ඉදිකරමින් පැවතුනු සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.15,007,728 ක මුදලක් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් වැයකර තිබුණි.

(ඊ ) <u>බේරුම් නොකළ බැරකම්</u>

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.18,651,556 ක්වූ අතර එම බැරකම් සියල්ල වර්ෂ 01 කට අඩු කාලයකට අයත් ඒවා විය.

1.6 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (i) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u> | | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක.41/90 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | - | වාහන වල ඉන්ධන දැවීම සෑම මාස 06 කට වරක්ම පරීක්ෂා කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂ වලදී ද එසේ පරීක්ෂා කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | රාජ්‍ය මුදල් / ජනාධිපති ලේකම් චක්‍රලේඛ<br>2010 ජූලි 14 දිනැති අංක.PF/FS/A.Vehi/2009 දරන චක්‍රලේඛයේ 5 ඡේදය 2013 ජූනි මස 05 දිනැති අංක. PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම් ලිපිය | - | අලුත්වැඩියා කළයුතු හෝ අපහරණය කළයුතු තත්ත්වයට පත්වී ඇති බව හඳුනාගෙන මාස 03 ක් ඇතුලත වාහන සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වුවද වර්ෂ 3 කට වැඩි කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබූ වාහන 2 ක් හා වර්ෂ 1 කට වැඩි කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබූ වාහන 4 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 අප්‍රේල් 29 දිනැති අංක.BD/NI/177/2013 ලිපිය | 185,920 | නිලධාරීන්ට වෙන් කර ඇති නිල වාහන සඳහා අනුයුක්ත කළ රියදුරන් වෙත යතුරු පැදි මිලදී ගැනීමට ප්‍රතිපාදන සලසා නොමැති බව මෙම ලිපියෙන් දන්වා තිබියදී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ රියදුරුහට නිවසේ සිට රාජකාරී සඳහා යාම් ඊම් වෙනුවෙන් යතුරුපැදියක් මිලදීගෙන ඔහුගේ පරිහරණය සඳහා ලබාදී තිබුණි. |
| (iv) | ප්‍රසම්පාදන චක්‍රලේඛ<br>2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛ අංක. 08 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 හා 4.3.2 ඡේද | - | එක් සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 10 ක් හෝ ඊට වැඩිවූ සංස්කෘතික මධ්‍යස්ථාන 06 ක් ඉදිකිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර අනුමත කිරීම සිදුකර නොතිබුණි. |
| (v) | 2006 ඔක්තෝබර් 17 දිනැති අංක.1467/15 රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය | - | 2006 අංක 01 දරන ආබාධිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන නියෝග |

| | | |
|---|---|---|
| | | අනුව ආබාධිත තැනැත්තන් හට ප්‍රසිද්ධ ගොඩනැගිලි තුලට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකාරයට නිර්මාණ සැලසුම් සකස් කර තිබිය යුතු වුවද, අමාත්‍යාංශය විසින් ඉදිකරනු ලබන සංස්කෘතික මධ්‍යස්ථානවල නිර්මාණ සැලසුම් එම විධිවිධාන අනුව පිළියෙල කර නොතිබුණි. |

## 1.7 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා</u>

<u>ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම</u>

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක බැගින් වූ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩ සටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන නිදහස් කර තිබූ පහත දැක්වෙන සංස්කෘතික මධ්‍යස්ථාන 02 ක ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය විසින් අතරමැද අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | මුළු පිරිවැය ඇස්තමේන්තුව | නිදහස් කළ මුදල | 2013.12.31 වන විට ගෙවීම් කළ වැඩ වටිනාකම | අත්හැර දැමීමට හේතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| රත්නපුර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය - රත්නපුර සංස්කෘතික මධ්‍යස්ථානය | 13,892,000 | 889,626 | 2,162,471 | භූමියේ අයිතිය පවරා ගැනීමෙන් තොරව ඉදිකිරීම් සිදුකිරීම |
| කහවත්ත ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය - කහවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය | 9,916,464 | 5,000,000 | 1,126,910 | ඉදිකිරීම් භූමිය නාය යාමට ලක්වීම |

## 1.8 කාර්යසාධනය

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 17 ක් සඳහා සංස්කෘතික මධ්‍යස්ථානය බැගින් පිහිටුවීමට 2000 වර්ෂයේ සිට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පැවතිය ද ඒවායේ ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොතිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 වන විට ඉදිකෙරෙමින් පවතින සංස්කෘතික මධ්‍යස්ථාන 6 ක ප්‍රගතිය පහත දැක්වේ.

| ව්‍යාපෘතිය (සංස්කෘතික මධ්‍යස්ථාන) | ඇස්තමේන්තුගත පිරිවැය | පළමු වාරිකය නිදහස් කළ වර්ෂය | නිදහස් කර තිබූ මුළු ප්‍රතිපාදනය 2013.12.31 දිනට | මුළු වියදම 2013.12.31 දිනට | මූල්‍ය ප්‍රගතිය මුළු ඇස්තමේන්තුගත පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස | 2013.12.31 දිනට පලමු වාරිකය නිදහස් කල වර්ෂයේ සිට ඉකුත් වූ වර්ෂ ගණන | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| ---------------- | --------------- | --------- | -------------- | --------------- | -------------------------- | ------------------- | ---------------- |
| | රු. | | රු. | රු. | | | |
| කොලොන්න සංස්කෘතික මධ්‍යස්ථානය | 16,029,924 | 2008 | 2,411,657 | 676,715 | 4.2 | වර්ෂ 5 ක් පමණ | අත්තිවාරම දමා ඇත |
| ඇහැලියගොඩ සංස්කෘතික මධ්‍යස්ථානය | 12,127,035 | 2010 | 4,962,538 | 3,779,927 | 31 | වර්ෂ 3 ක් පමණ | පළමු මහලේ ස්ලැබ් එක දක්වා ඉදිකර ඇත. |
| ඕපනායක සංස්කෘතික මධ්‍යස්ථානය | 14,221,718 | 2010 | 2,926,812 | 2,859,309 | 20 | වර්ෂ 3 ½ ක් පමණ | බිම් මහල ඉදිකර වහල ගසා ඇත |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වැලිගෙපොල සංස්කෘතික මධ්‍යස්ථානය | 11,040,647 | 2010 | 2,876,890 | 2,039,278 | 18 | වර්ෂ 3 ක් පමණ | අත්තිවාරම මත කොන්ක්‍රීට් කණු ඉදිකර ඇස්බැස්ටස් වහල ගසා ඇත. |
| ගොඩකවෙල සංස්කෘතික මධ්‍යස්ථානය | 1,954,332 | 2009 | 1,954,332 | 1,954,332 | 100 | වර්ෂ 4 ක් පමණ | පැරණි ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කර ඇත. |
| ඉඹුල්පෙ සංස්කෘතික මධ්‍යස්ථානය | 10,073,248 | 2010 | 5,000,000 | 4,374,882 | 43 | වර්ෂ 3 ක් පමණ | ප්‍රධාන බිත්ති බැඳ වහල ඉදිකර ඇත. |
| | --------------- | | ------------- | ------------- | | | |
| | 65,446,904 | | 20,132,229 | 15,684,443 | | | |
| | =========== | | ========= | ======== | | | |

(i) මෙම ඉදිකිරීම් වලදී පහත දැක්වෙන පොදු දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් වෙත ප්‍රතිපාදන මුදා හැරීමට පෙර එම ආයතන සමග ලිඛිත එකඟතාවකට හෝ අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු නොකිරීම.

- ඉදිකිරීම් වලට අදාල මුළු පිරිවැය ඇස්තමේන්තු, සැලසුම්, එක් එක් අදියරයන්ට අදාල කාලවකවානු හා ප්‍රගතිය ඇතුලත් විස්තරාත්මක වාර්තා පිළියෙල නොකිරීම.

- ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හා නිදහස් කිරීම අවිධිමත් ආකාරයෙන් සිදුකර තිබීම හා ඉදිකිරීම් පිළිබඳ කිසිඳු අධීක්ෂණයක් සිදුකර නොතිබීම. භෞතික ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාවකින් තොරව ප්‍රතිපාදන නිදහස් කිරීම.

- ඉහත සංස්කෘතික මධ්‍යස්ථාන 06 සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සමග ලිපි හුවමාරුව, සුදුසු බිම් ප්‍රදේශය තෝරා ගැනීමට හා ශක්‍යතා වාර්තාව ලබාගැනීමට වර්ෂ 05 සිට 10 දක්වා කාලයක් ගතවී තිබුණි. තවද එම මධ්‍යස්ථාන සඳහා මුල් වාරික නිදහස් කර වර්ෂ 03 සිට 06 දක්වා වූ කාල පරාසයක් ඉක්මවා තිබුණද එම කිසිඳු ව්‍යාපෘතියක ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි.

(ii) සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.16,029,924 ක්වූ කොළොන්න සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ සිට ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. 2013 ජූලි 30 දක්වා නිදහස් කර තිබූ මුළු මුදල රු.2,411,657 ක් විය. 2013 දෙසැම්බර් 31 දින වන විට රු.676,715 ක් වැයකර අත්තිවාරම පමණක් ඉදිකර තිබූ අතර ඒ වනවිට වර්ෂ 05 කට පමණ ආසන්න කාලයක් ගතවී තිබුණද එම ඉදිකිරීම් නිමකර නොතිබුණි.

(iii) ආදිවාසී ප්‍රජාවට ස්ථිර නිවාස ඉදිකිරීමේ අරමුණින් පළමු අදියර යටතේ නිවාස 100 ක් ඉදිකිරීම සඳහා 2011 , 2012 වර්ෂ වල මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල වන රු.13,159,000 ක් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. 2012 අප්‍රේල් වන විට වැඩ අවසන් කිරීමට ඉලක්ක කර තිබුණද නිවාස 30 ක ඉදිකිරීම් 2013 දෙසැම්බර් 31 වනවිටත් අවසන් කර නොතිබුණි.

(iv) දෙවන අදියර යටතේ දඹාන ප්‍රදේශයේ නිවාස 25 ක් ඉදිකිරීමට සැලසුම් කර 2013 වර්ෂයේ රු. මිලියන 5 ක ප්‍රතිපාදන ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණද එම ඉදිකිරීම් කටයුතු 2014 මැයි වනවිටත් අවසන් කර නොතිබුණි.

## 1.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන වල අලුත්වැඩියා, නඩත්තු, සංරක්ෂණ හා ඉදිකිරීම් වලදී පැන නැගී ඇති ගැටළු නිරාකරණය කිරීමේ අරමුණින් 2009 පෙබරවාරි 19 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක. අමප/09/0193/354/003 මගින් සීමාසහිත සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගම පිහිටුවා තිබුණද එම සමාගමේ ක්‍රියාකාරීත්වයේ මතභේදාත්මක අවස්ථා නිරීක්ෂණය විය.

(i) මෙම සමාගම පිහිටුවීමේ අරමුණුවලින් බැහැරව වර්තමානයේ මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා ශ්‍රමිකයින් සපයන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර මෙම සමාගමේ සේවකයින් සඳහා වැටුප් ගෙවීමට මධ්‍යම සංස්කෘතික අරමුදලට සිදුවී තිබුණි. 2013 වර්ෂය වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.114,879,000 ක් වූ අතර සමාගම උපයන ලද ලාභය සියයට 35 – 40 අතර වන බව නිරීක්ෂණය විය.

(ii) සමාගම පිහිටුවීම් සඳහා ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, සංරක්ෂණ ස්වරූපයේ වන සුවිශේෂී තත්ත්වය යටතේ සිදු කරගත යුතු සංවර්ධන කටයුතු සඳහා එම සුවිශේෂී තත්වය හඳුනාගත හැකි විශේෂ ආයතනයක් ලෙස මෙය පිහිටුවීම අරමුණු කර තිබුණද මෙම සමාගම එවන් තාක්ෂණික හැකියාවන්ගෙන් යුත් ආයතනයක් ලෙස වර්ධනය වී නොතිබුණි.

(iii) සමාගමේ සේවය සඳහා යොදාගන්නා මධ්‍යම සංස්කෘතික අරමුදලේ යන්ත්‍රසූත්‍ර වලින් යම් ආදායමක් අරමුදලට ලබාගැනීම අපේක්ෂා කළද, සමාගම විසින් අරමුදලට ආදායමක් ලබාදෙන අයුරින් යන්ත්‍රසූත්‍ර ප්‍රයෝජනයට ගෙන තිබූ බව තහවුරු නොවුණි.

(iv) ආරම්භයේදී අමාත්‍යාංශ ලේකම්වරයා නිල බලයෙන් සමාගමේ සභාපතිවරයා ලෙස කටයුතු කර තිබුණද මේ වන විට සමාගමේ පාලනාධිකාරය තුළට අමාත්‍යාංශයේ කිසිඳු නිලධාරියකු ඇතුළත්ව නොතිබීම.

(v) ටෙන්ඩර් කැඳවීමෙන් තොරව මෙම සමාගම වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණද මධ්‍යම සංස්කෘතික අරමුදල හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ඇතැම් ඉදිකිරීම් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මෙම සමාගම වෙත පවරා තිබීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ යොමු අංක 3.5 (ඉ) විධිවිධාන උල්ලංඝනය කර තිබුණි.

1.10 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

අමාත්‍යාංශය විසින් එළඹ තිබූ විධිමත් බවින් තොර ගනුදෙනු පිළිබඳ පහත නිරීක්ෂණය කෙරේ.

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) තම නිත්‍ය තනතුරට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ රාජකාරී ආවරණය සඳහා පත්කර තිබුණු අතර ඔහු විසින් නිත්‍ය තනතුරට හිමි වෙන් කළ වාහනයට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාහනයක්ද භාවිතා කර තිබුණි. වාහනය භාවිතා කල 2013 ජනවාරි 01 දින සිට අප්‍රේල් 23 දින දක්වා කාලයට අදාලව රියදුරු අතිකාල හා ගමන් වියදම් ලෙස මධ්‍යම සංස්කෘතික අරමුදලින් රු.86,463 ක්ද සංස්කෘතික අමාත්‍යාංශය වෙතින් රු. 51,285 ක්ද වැයකර තිබුණි.

1.11 **<u>අනාර්ථික ගනුදෙනු</u>**

සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් පිළිබඳ නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

පහත දැක්වෙන ඉදිකිරීම් සිදුකිරීමට පෙර අදාල ඉඩම් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත පවරා නොගැනීම හේතුවෙන් ඒ සඳහා දරන ලද රු.15,809,299 ක වියදම් අනාර්ථික තත්ත්වයට පත්වී තිබුණි.

| සංස්කෘතික මධ්‍යස්ථානයේ නම | අලුත්වැඩියා / නව ඉදිකිරීම් සඳහා දරන ලද මුළු වියදම | අනාර්ථික තත්ත්වයට පත්වීම |
|---|---|---|
| | රු. | |
| රත්නපුර සංස්කෘතික මධ්‍යස්ථානය | 2,162,471 | භූමියේ අයිතිය පවරා නොගෙන ඉදිකිරීම් සිදුකිරීම හේතුවෙන් එම භූමිය හා කලවැඩ කොටස ඉඩම් හිමි ආයතනය පවරා ගැනීම |
| ඇලපාත සංස්කෘතික මධ්‍යස්ථානය | 2,990,611 | භූමියේ අයිතිය පවරා නොගෙන ඉදිකිරීම සිදුකළ පසු ඉඩම හිමි ආයතනයේ ප්‍රයෝජනය සඳහා නැවත ලබාදීමට සිදුවීම |

| | | | |
|---|---|---|---|
| නිවිතිගල සංස්කෘතික මධ්‍යස්ථානය | | 1,181,200 | භූමියේ අයිතිය පවරා නොගෙන ඉදිකිරීම් සිදු කිරීමෙන් පසු ඉඩම් හිමි ආයතනය ඉඩම ලබාදීමට එකඟ නොවීම |
| කහවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය | | 1,126,910 | ඉදිකිරීම් භූමිය නායයාම |
| ඇඹිලිපිටිය සංස්කෘතික මධ්‍යස්ථානය | | 8,348,107 | භූමිය පවරා නොගෙන ඉදිකිරීම් සිදුකළ ද පසුව එය පවරා ගැනීම ගැටලු සහගත වීම. |
| | | 15,809,299 | |
| | | ======== | |

1.12 **කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

සෑම වර්ෂයකම වර්ෂය අවසානයේ හෝ ඊට ආසන්න දිනයකදී ආයතනය සතු වත්කම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහන 52 ක් සම්බන්ධයෙන් කිසිදු සමීක්ෂණයක් 2013 වර්ෂය අවසානය දක්වා සිදුකර නොතිබුණි. මේ අනුව එම වාහන වල උපාංග නැතිවීම්, අක්‍රියවීම් හා ඉවත් කිරීම පිළිබඳ තොරතුරු අනාවරණය වී නොතිබුණි. තවද වාහන සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයේ එම වාහන වල පිරිවැය, ක්ෂය අනුපාතය, අපහරණය කිරීම් විස්තර ඇතුලත් කර යාවත්කාලීන කිරීම් සිදුකර නොතිබුණි.

1.13 **මානව සම්පත් කළමනාකරණය**

(අ ) **අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 14 | - | - |
| (ii) | තෘතීයික මට්ටම | 579 | 513 | 66 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 04 | 02 | 02 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 409 | 397 | 12 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 19 | - | 19 |
| | එකතුව | 1006 | 926 | 80 | 19 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 80 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) <u>වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්</u>

අමාත්‍යාංශය විසින් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශව | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| වීඩියෝ කැමරා ශිල්පී | 1 | මධ්‍යම සංස්කෘතික අරමුදල | 1989.06.01 සිට මේ දක්වා |
| කැමරා ශිල්පී | 1 | - එම - | - එම - |
| කැමරා ශිල්පී | 1 | - එම - | 2001.01.27 සිට මේ දක්වා |
| ලිපිකරු | 1 | - එම - | 2000.04.09 සිට මේ දක්වා |
| කම්කරු | 4 | - එම - | අනාවරණය නොවුණි |

**2 කොටස**

2. **ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------

## 2.1 විගණන විෂය පථය

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 19 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2.3 **විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ ) **ගිණුම් ඉදිරිපත් කිරීම**

දෙපාර්තමේන්තුව විසින් 2014 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 20601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය |

(ආ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක. 842 |
| විසර්ජන වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 (1) (3) (4) (6) (7) (9 ) |
| පරිගණක වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක.1A1/2002/02 |
| ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය (ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල) | මුදල් රෙගුලාසි 751, 754 හා 454 |

(ඈ) <u>විගණන සාක්ෂි නොවීම</u>

විගණන සාක්ෂි නොවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) 2013 වර්ෂය අවසන් වන විට ආරම්භ කර තිබූ මුළු ප්‍රාදේශීය හා ග්‍රාමීය සංස්කෘතික බල මණ්ඩල සංඛ්‍යාව, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් බල මණ්ඩල වල අරමුදල් පිහිටුවීම හා ඒවා වියදම් කිරීම පිළිබඳ විස්තර, එක් එක් බල මණ්ඩල සඳහා විගණනයට ඉදිරිපත් නොවූ හෙයින් එම ගනුදෙනු සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ii) ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් භෞතික පැවැත්ම තහවුරු කර නොතිබීම හේතුවෙන්, විසර්ජන ගිණුම සටහන (i) යටතේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව මගින් දක්වා තිබූ රු.38,838,583 ක ශේෂයෙහි නිවැරදිතාව විගණනයට තහවුරු නොවුණි.

(ඇ) <u>අයවැය විචලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලධන වැය විෂයයන් 8 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 60 සිට 90 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) වැය විෂයය අංක. 206-2-3-2-2502 (දැයට කිරුළ) යටතේ "උතුරු දකුණු මිතුරු සෙවණ" මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා මුදල් රෙගුලාසි 66 මගින් මාරු කර තිබූ රු. මිලියන 8 කින් රු.6,639,508 ක් හෙවත් සියයට 83 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(iii) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව අනුව 2013 වර්ෂයේ එකතු කිරීම් වටිනාකම, මූලධන වියදම (DGSA – 4) හි දක්වා ඇති වටිනාකම සමග සැසඳීමේදී රු.724,257 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) <u>පොදු තැන්පත් ගිණුම</u>

වර්ෂ 2 ඉක්මවූ රු.683,631 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක. 20601 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,046,385 ක් වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ රජයේ නිලධාරීන්ට ණය අත්තිකාරම් පාලන ගිණුමේ හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව හර ශේෂය අතර රු. 60,556 ක වෙනසක් පැවතුණි. 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය පරිදි වෙනසට හේතු පැහැදිලි කෙරෙන සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු ණය අත්තිකාරම් පාලන ගිණුමේ හර ශේෂය අතර රු.336,071 ක වෙනසක් පැවතුණි. 1994 අගෝස්තු 18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි එම වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

2.4 **යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

2.4.1 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2013 මැයි 13 දිනදීය.

2.4.2 **අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු සිදුකළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

2.5 **වත්කම් කළමනාකරණය**

(අ ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක. පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක.441 දරන

රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2014 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුණේ 2012 වර්ෂය වෙනුවෙනි.

(ii) ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල පරිශ්‍රයේ 2012 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් පෙන්වා දී තිබුණු භාණ්ඩ වර්ග 08 ක් සම්බන්ධ අයිතම 36 ක අතිරික්ත මෙන්ම භාණ්ඩ වර්ග 123 ක ඌනතා සම්බන්ධයෙන් හා අනිකුත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 හා 757 (2) පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) <u>බේරුම් නොකළ බැරකම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.41,581,381 ක්වූ අතර එම බැරකම් සියල්ල වර්ෂ 1 කට අඩු කාලපරිච්ඡේදයකට අයත් ඒවා විය.

(ii) අංක. 206-2-3-6-1405 (ජාතික කලා උළෙල) වැය විෂයය යටතේ ප්‍රවර්තන වර්ෂයට අදාල සේවාවන් වෙනුවෙන් පියවිය යුතුව තිබූ රු.1,489,784 ක් නොපියවූ බැරකම් තුලට ඇතුලත් කර නොතිබුණි.

(iii) අංක. 206-2-3-7-2502 (ජෝන් ද සිල්වා කලා නිකේතනය ඉදිකිරීම) වැය විෂයය යටතේ කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවීමට බැඳී තිබෙන රු.937,862 ක වටිනාකම විසර්ජන ගිණුමේ DGSA - 8 (ii) බැඳීම් ප්‍රකාශනයේ සටහන් කර නොතිබුණි.

2.6 <u>අනුකූල නොවීම්</u>

(අ ) <u>නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ---------------------------------- | ------------- | -------------------- |
| | රු. | |
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.18 වගන්තිය | 26,000 (ආපදා ණය) | වර්ෂ 4 ක කාලයක් සඳහා වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන 2009 අගෝස්තු 20 දින විදේශගත වූ නිලධාරියකුගේ ණය ශේෂය විධිවිධාන පරිදි අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. |
| (ii) <u>මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | | |
| මුදල් රෙගුලාසි 94 (i) | 1,150,359 | වැය විෂයය 4 ක මුළු එකතුව රු.46,697 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.1,150,359 ක්වූ බැරකම් සඳහා බැඳී තිබුණි. |
| මුදල් රෙගුලාසි 102, 103 හා 104 | - | රාජ්‍ය සංගීත කණ්ඩායම භාරයේ හා ජාතික කලාභවන පරිශ්‍රය තුල තිබී අස්ථානගත වූ භාණ්ඩ අයිතම 08 කට අදාල භාණ්ඩ ඒකක 13 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 102, 103 හා 104 පරිදි කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 128 (1) (ඉ) | - | ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල පරිශ්‍රයේ ගබඩා කර තිබූ මිල අධික නර්තන හා වාද්‍ය උපකරණ හානියට පත් නොයන අයුරින් ආරක්ෂිතව ගබඩා කර තබා ගැනීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන යොදා නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 396 | 90,079 | 2013 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 6ක් ඉක්මවා තිබූ රු. 90ල079ක් වටිනා චෙක්පත් 21ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 පරිදි කටයුතු කර නොතිබුණි. |

## 2.7 කාර්යසාධනය

### ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 2013 වර්ෂයේදී සංස්කෘතික බල මණ්ඩල මගින් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ සටහන් 10 ක් සැලසුම් කර තිබූ අතර 2013 ජුනි 30 දින වන විට එම වැඩ සටහන් 10 න් 04 ක් අවසන් කළ යුතුව තිබුණද නිමකර තිබුණේ වැඩ සටහන් 02 ක් පමණි. තවද සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම එක් කලාකරුවෙකු සඳහා නිවසක් තනාදීමේ ව්‍යාපෘතියක් සැලසුම් කර තිබුණද 2013 වර්ෂය අවසානය වන විටත් එක් කලාකරුවකු සඳහා හෝ නිවසක් ඉදිකරදී නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ සංස්කෘතික ප්‍රවර්ධන කටයුතු ග්‍රාමීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමේ අරමුණින් සමෘද්ධි කලාප පදනම් කරගෙන ග්‍රාමීය සංස්කෘතික බල මණ්ඩල පිහිටුවීමට තීරණය කර තිබුණද 2013 වර්ෂය තුලදී ග්‍රාමීය බල මණ්ඩල මගින් කිසිදු වැඩ සටහනක් ක්‍රියාත්මක කළ බවට තොරතුරු නොමැති බැවින් සංස්කෘතික බල මණ්ඩල පිහිටුවීමේ අරමුණ සාර්ථක වී ඇති බව තහවුරු නොවුණි.

(iii) මාස 03 කට වරක් පළාත් මට්ටමින් සංස්කෘතික අධ්‍යක්ෂ හෝ ඔහු නම් කරන නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් සංස්කෘතික බල මණ්ඩල වල ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් 01 ක් බැගින් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පළාත් 4 ක පමණක් ප්‍රගති සමාලෝචන රැස්වීම් 1 බැගින් පවත්වා තිබූ අතර අනිත් පළාත් 4 හි රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. මේ අනුව සංස්කෘතික බල මණ්ඩල ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රගතිය ලගාකර ගෙන නොතිබුණි.

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළයුතු ශේෂ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තර | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | මාස 06 ට | වර්ෂ 01 ට වැඩි | වර්ෂ 03 ට | |

| | | වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 03 ට අඩු | වැඩි | |
|---|---|---|---|---|---|
| | --------------------------- | -------------- | -------------- | -------------- | ---------- |
| | | රු. | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 5,146 | 14,366 | 14,280 | 33,792 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 90,079 | - | - | 90,079 |
| (iii) | හඳුනා නොගත් හර | 6,104 | - | - | 6,104 |
| (iv) | හඳුනා නොගත් බැර | 13,358 | - | - | 13,358 |

වර්ෂ 1 ට වැඩි හා වර්ෂ 3 ට අඩු උපලබ්ධි නොවූ තැන්පතු රු.14,366 ක් සහ වර්ෂ 03 ට වැඩි උපලබ්ධි නොවූ තැන්පතු රු.14,280 ක් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

හඳුනා නොගත් බැර ශේෂ රු. 13,358 ක් හා හර ශේෂ 6,104 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.9 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ මතභේදයට තුඩුදෙන ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

(i) 2013 රාජ්‍ය සාහිත්‍ය උත්සවය පැවැත්වීම වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.7,191,881 ක් වූ අතර උත්සවයේ සංවිධාන කටයුතු හා එය පැවැත්වීම වෙනුවෙන් එයින් රු.4,566,538 ක් වැයකර තිබුණි. රජයේ මැදිහත්වීම යටතේ මෙම උත්සවය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ සාහිත්‍යකරුවන් ජාතික වශයෙන් ඇගැයීමට ලක්කිරීම වුවද සාහිත්‍යධරයන් ඇගයීම වෙනුවෙන් සම්මාන හා ත්‍යාග පිරිනැමීම සඳහාත් ඔවුන්ගේ ග්‍රන්ථ සමීක්ෂණය කිරීමේ කටයුතු සඳහාත් වැයකර තිබූ මුදල රු.2,625,343 ක් එනම් මුළු වියදමින් 36 % පමණක් විය. මේ අනුව වියදමින් වැඩි ප්‍රතිශතයක් අදාල අරමුණ වෙනුවෙන් වෙන්කර නොතිබීම හේතුවෙන් එම වියදම්වල ඵලදායී බව මතභේදයට තුඩුදේ.

(ii) සංස්කෘතික බල මණ්ඩල හරහා 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද "දේශීය ආහාර සංස්කෘතික ප්‍රවර්ධන වැඩ සටහන" සඳහා මූලික වියදම් ඇස්තමේන්තුවක්

සැකසීමෙන් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 215 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 23 සඳහා රු.2,700,000 ක් මුදාහැර තිබුණි.

2.10 **අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු පහත සඳහන් ගනුදෙනුව විධිමත් බවින් තොර බව නිරීක්ෂණය විය.

(අ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

2013 රාජ්‍ය සාහිත්‍ය උත්සවය සඳහා සාහිත්‍ය විශේෂ කලාපය, ආරාධනා පත්‍ර, ලිපි කවර, සමරු කලාප, සහතික පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් 2013 ජූලි 15 දින පෙ.ව.10.30 ට පෙර මිල ගණන් එවන ලෙස 2013 ජූලි 01 දින සීමිත මිල කැඳවීම් කර තිබුණි. නමුත් ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණේ මිල ගණන් ඉදිරිපත් නොකරන ලද සමාගමක් වෙතටය. ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව එම ආයතනය වෙතට මුද්‍රණ කාර්යය පවරා එම මුද්‍රණ වියදම් ලෙස රු.972,982 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. මිල ගණන් ඉදිරිපත් කළ ආයතන වලින් මෙම කාර්යයන් ඉටුකර නොගැනීම නිසා දෙපාර්තමේන්තුවට සිදුවූ පාඩුව රු.130,720 ක් විය.

2.11 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ------------------ | ------------ | --------------- | ------------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 11 | 14 |
| (ii) | තෘතීයික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 524 | 459 | 65 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 89 | 51 | 38 |
| (v) | වෙනත් | 82 | 70 | 12 |

| | | | |
|---|---|---|---|
| (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | -------- | -------- | -------- |
| | 723 | 592 | 131 |
| | ===== | ===== | ===== |

- සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 131 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.